**ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය - 2021**

**-------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ "සමාගමේ" 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10, 2022 නොවැම්බර් 15 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගම් පනතේ 242 වගන්තියට අනුව ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම, ICTA සමග ඒකාබද්ධ කිරීමට අනුමැතිය ලබා දී ඇතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ශේෂ පත්‍ර දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දී ඇති දිනය අතර එනම් 2022 දෙසැම්බර් 15 වැනි දින LKAS 10 අනුව මෙම ඒකාබද්ධ කිරීමේ තීරණය ගෙන ඇත. කෙසේ වෙතත්, මෙය වාර්තාකරන කාල සීමාවෙන් පසුව ඇති වූ තත්වයන් සමඟ කටයුතු කරන බැවින් නොගලපනුලබන හෙළිදරව් කළ යුතු සිදුවීමකි. අප විසින් LKAS-10 ට අනුව අවශ්‍ය පරිදි මෙම ගැලපුම් නොවන සිදුවීම හෙළි කිරීමට අසමත් වීම පිළිගන්නෙමු. | ප්‍රමිතියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2020 සැප්තැම්බර් 14 වන දින ආරම්භ වී 2021 මාර්තු 13 වනදායින් අවසන් වන පරිදි General Cluster of Lanka Government Cloud 2.0 සඳහා Bare-metal Server පහසුකම් සැපයීම සඳහා සමාගම Softlogic Information Technologies (Pvt) Ltd සමඟ අංක: ICTA/GOSL/SER/NCB/ 2016/35 දරන ගිවිසුමට එළඹ තිබුණි.<br>2021 සැප්තැම්බර් 13 සිට 2022 මාර්තු 14 දක්වා කාලය සඳහා 2 වැනි පෙර ගෙවීම ලෙස රු.11,394,000 2021.12.31 දින ගෙවා තිබුණි.<br>2022 ජනවාරි 01 සිට 2022 මාර්තු 13 දක්වා කාලය සඳහා වූ රු. 439,584 ක මුදල, පෙර-ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට | Softlogic Information Technologies (Pvt.) Ltd ආයතනයට ගෙවන ලද පෙරගෙවුම් මුදල වූ රු.439,584 හඳුනා ගැනීමට අප අසමත් වූ බව පිළිගන්නිමු.<br>කෙසේ වෙතත්, මෙම පෙරගෙවුම් මුදල ගිණුම්කරණය ශුද්ධ අතිරික්තය/හිගය කෙරෙහි බලපාන්නේ නැති බව සඳහන් කිරීම වැදගත්ය.<br>පෙරගෙවුම් ලෙස වාර්තා නොකර සම්පූර්ණ මුදලම වියදමක් ලෙස අය කර ඇති අතර, එම සම්පූර්ණ මුදලම ප්‍රදාන ආදායම ලෙස සටහන් කරන බැවින් එමඟින් අතිරික්තය/හිගය කෙරෙහි බලපෑමක් නොමැත. එසේම ඊට ප්‍රතිවිරුද්ධව සැලකීමේ දී, පෙරගෙවුම් වාර්තා කරන්නේ නම්, වියදම් පෙරගෙවුම් ප්‍රමාණයෙන් අඩු වනු ඇත.<br>ඊට සමගාමීව, ප්‍රදාන ආදායම ද එම ප්‍රමාණයෙන් අඩු වනු ඇත. අනාගතයේ ආදායම හඳුනා ගැනීම සඳහා අපට පෙරගෙවුම් මුදල විලම්බිත ප්‍රදාන ආදායමක් ලෙස සටහන් කිරීමට සිදුවනු ඇත. | සමාගම පෙරගෙවුම් හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2021 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු අරමුදල් රු. 6,868,498 ක් ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව, වැටුප් ගෙවීම සඳහා බාහිර සමාගමෙන් ලැබිය යුතු ශේෂය ණයගැති ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමේ ජංගම වත්කම් සහ වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් තිබුණි. | EPF/ETF සහ සේවකයන්ට ගෙවන වැටුප් සඳහා වෙනම අරමුදල් ඉල්ලීමක් නොකල, EPF සහ ETF ඇතුළුව සම්පූර්ණ වැටුප් ගෙවීම සඳහා මුදල් එකවර තාක්ෂණ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටී. මෙම අරමුදල් භාණ්ඩාගාරයෙන් ලැබුණු පසු, වැටුප් සැකසීම සඳහා, EPF, ETF, PAYE සහ අනෙකුත් අදාළ ගෙවීම් සඳහා ද ඒවා SSP (සේවා සපයන්නා) වෙත මාරු කරනු ලැබේ.<br>අරමුදල් සාමාන්‍යයෙන් සෑම මසකම 20 සහ 25 අතර SSP වෙත මාරු කරනු ලැබුවද, EPF සහ ETF සඳහා ගෙවිය යුතු දිනය ඊළඟ මාසය අවසානයේ වන බැවින්, SSP විසින් EPF සහ ETF ගෙවීම් ඊළඟ මාසයේ දී සිදු කරන බව සැලකිල්ලට ගත යුතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, SSP විසින් ඊළඟ මාසය අවසන් වන තෙක්, විශේෂයෙන් පසුකාලීන වැටුප් සඳහා ගැලපීම් වෙනුවෙන් අරමුදල් රඳවා තබා ගන්නා බව සැලකිය යුතුය.<br>දෙසැම්බර් මාසය සඳහා වන EPF සහ ETF ගෙවීම් සම්බන්ධයෙන්, අරමුදල් දැනටමත් SSP වෙත මාරු කර ඇති බැවින්, ඒවා ගෙවිය යුතු ලෙස අප ගණන් නොගත් බව පැහැදිලි දැක්විය යුතුය.<br>නිවැරදිවම ප්‍රකාශ කිරීමේදී නම්, දෙසැම්බර් මාසය සඳහා EPF සහ ETF තාක්ෂණික වශයෙන් ගෙවිය යුතුව ඇති බව කෙනෙකුට තර්ක කළ හැකි අතර, SSP වෙත මාරු කරන ලද මුදල දෙසැම්බර් අවසානයේ ලැබිය යුතු යැයි සැලකිය හැක. කෙසේ වෙතත්, අනාගතයේදී එවැනි සංකූලතා වැලැක්වීම සඳහා, අරමුදල් මාරු කළ මාසය තුළම EPF සහ ETF ගෙවීම් ක්‍රියාවට නංවන ලෙස අපි විසින් දැනටමත් SSP ආයතනය වෙත දැනුම් දී ඇති බව සඳහන් කළ යුතුය. | ලැබිය යුතු සහ ගෙවිය යුතු සියල්ල ගිණුම්ගත කළ යුතුය. |

**1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගම විසින් 2021 සහ 2022 වසරවලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු.4,983,947 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා යුද හමුදාවට | තාක්ෂණ අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා හමුදාවට පවරා ඇති වත්කම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගන්නා ලද බව පිළිගන්නා බව.<br>සමාගම් ලේකම්වරයා සමඟ ඇති සියලුම ලිපි | ස්ථාවර වත්කම් පැවරීමට පෙර අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

| | |
|---|---|
| (ARMY) සහ තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. | හුවමාරු සහ උපදේශන හොඳින් පරීක්ෂා කළද, වත්කම් පැවරීම සඳහා මණ්ඩලයෙන් ලබාගත් අනුමැතිය සම්බන්ධයෙන් ලියකියවිලි කිසිවක් සොයාගත නොහැකි විය. |

**1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාළව අලාභය රු.41,648,126 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු.109,986,309 ක් විය. තවද, සමාගමේ හිමිකම 2021 දෙසැම්බර් 31 දිනට රු.109,986,289ක ඍණ අගයක් ලෙස වාර්තා කර ඇත.<br>එබැවින්, රජයේ අඛණ්ඩ සහයෝගය නොලබන්නේ නම්, සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වී තිබුණි. | 2023 වර්ෂය සඳහා වන මෙහෙයුම් සහ ව්‍යාපෘති අයවැය යන දෙඅංශයේම අනුමැතිය මත ICTA හි ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩ පැවැත්ම රඳා පවතින බව හොඳින් වටහාගෙන ඇත. ICTA සඳහා 2023 වසර සඳහා ඉල්ලා සිටින මිලියන 6,583.10 අයවැයෙන්, අමුණා ඇති ඇමුණුමට අනුව NPD අනුමත ව්‍යාපෘති සහ මෙහෙයුම් යන දෙකටම මිලියන 6,556ක් අනුමත කර ඇත. එබැවින් ICTA හි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළුවක් නොමැත. තවද, ICTA හි පවතින අඛණ්ඩ පැවැත්මේ ගැටළු සම්බන්ධ කිසිදු කරුණක් පිළිබඳව අපට විධිමත් ලෙස දැනුම් දී නොමැත.<br>ඍණ ශුද්ධ වත්කම් යනු පාඩු හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුවක් නිර්මාණය කරන, සැබෑ ඍණ වත්කමක් නොවන බව ද පැහැදිලිය. | අවදානම අවම කිරීමට සමාගම පියවර ගත යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වැටුප් සැකසීමේ සමාගමට අරමුදල් මාරු කර කිරීම. | 342,428,694 | කුවිතාන්සිය | වැටුප් ගෙවීමට අවශ්‍ය අරමුදල් දැනටමත් අප වෙත ලබා දී ඇති බැංකු ගිණුම් විස්තර මත පදනම්ව SSP වෙත මාරු කර ඇත. මාරු කරන ලද අරමුදල් දැනටමත් වැටුප් ගෙවීම සහ අදාළ වියදම් සඳහා භාවිතා කර ඇත. අනෙක් අතට, SSP වැටුප් ගෙවීම සඳහා මෙම අරමුදල් භාවිතා කරන බැවින් එය අරමුදල් සඳහා කුවිතාන්සියක් ලෙස සැලකිය හැකිය. කෙසේ | සියලුම ගෙවීම් කුවිතාන්සි සමඟ තිබිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වෙතත් ඉදිරියට SSP වෙතින් කුවිතාන්සියක් ලබා ගැනීමට අපි සහතික වන්නෙමු. | |
| (ආ) | වාහන කුලිය ගෙවීම | 5,829,600 | කුවිතාන්සිය | වාහන කුලිය සම්බන්ධයෙන්, චෙක්පත අපෙන් ලබා ගන්නා අවස්ථාවේදී කුවිතාන්සියක් සපයන ලෙස සැපයුම්කරුගෙන් ඉල්ලා සිටීම ප්‍රායෝගික නොවේ. එම නිසා චෙක්පත එකතු කිරීම සඳහා වවුචරයේ මුහුණතෙහි ඇති පිලිපත සැපයුම්කරුගෙන් කුවිතාන්සියක් ලබා ගැනීමේ අරමුණට ප්‍රමාණවත් ලෙස භාවිත කළ හැකි බව අපි විශ්වාස කරමු. | සියලුම ගෙවීම් කුවිතාන්සි සමඟ තිබිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට Sri Lanka Computer Emergency Response Team (Pvt) Ltd (CERT) වෙත ගෙවිය යුතු ඉතිරි මුදල රු. 40,215,928 ක් වූ අතර එය පියවීමකින් තොරව දීර්ඝ කාලයක් පැවතුණි. | CERT සම්බන්ධයෙන්, ගෙවීමට කිසිවක් නොතිබූ බැවින් ඒවා සම්බන්ධයෙන් අපට වගකීමක් නොමැත.<br>CERT හි කොටස් මාරු කරන අවස්ථාවේ දී CERT විසින් සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ගෙවීම් පියවා ඇත.<br>මෙම ගෙවිය යුතු ශේෂය ගිණුම්කරණ දෝෂයක ප්‍රතිඵලයක් බව අපි දැනටමත් තාක්ෂණ අමාත්‍යාංශයට සහ CERT වෙත සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් කර ඇත.<br>මෙම හිඟ ශේෂය නිවැරදි කිරීමට MOT දැනටමත් පියවර ගෙන ඇති බව ඔබ සැවොම හොඳින් දනී. | ශේෂය පියවීමට සමාගම පියවර ගත යුතුය |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | 2007 අංක 07 දරන සමාගම් පනත, 133(1) වගන්තිය | සෑම වර්ෂයකටම වරක්ම කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. සමාගම වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | මූල්‍ය ගිණුම් සකස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීම ප්‍රමාද විය. | සමාගම් පනතේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| ආ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: පීඊඩී/12, 5.2. 4 පරිච්ඡේදය | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර වාර්ෂික අයවැය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. තවද, අවසාන අනුමත අයවැයේ පිටපත් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට නොඅඩු කාලයකට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාර සහ විගණකාධිපති වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත්, චක්‍රලේඛයට අනුව 2021 වසර සඳහා වන අයවැය සමාගම විසින් සකස් කර නොතිබුණි. | 2021 වසර සඳහා දැනටමත් සකස් කර ඇති අයවැය දැනටමත් ඔබ සැමට දන්වා ඇත. අයවැය සඳහා මණ්ඩල අනුමැතියට අයවැය ඉදිරිපත් කළද සොයා ගැනීමට නොහැකි විය. ICTA ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් 2021 වසර සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය ජනාධිපති ලේකම් කාර්යාලයට ලිපියක් මගින් දැනුම් දී ඇත. ඉන් අනතුරුව, තාක්ෂණ අමාත්‍යාංශය විසින් 2021 වසර සඳහා ICTA හි අනුමත අයවැය පිළිබඳ දන්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොතිබුණත්, 2021 වසර සඳහා වන අයවැය සඳහා ICTA සාර්ථකව සකස් කර අනුමැතිය ලබාගෙන ඇති බව මෙම ලේඛන මගින් පෙන්නුම් කරයි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර කටයුතු කළ යුතුය |
| ඇ) | මුදල් රෙගුලාසි 267. | සේවකයෙකුගේ වැටුප දායකයාටම ගෙවිය යුතු අතර ඔහුගේ අත්සන වැටුප් ලේඛනයේ තබා ගත යුතුය, නැතහොත් රිසිට්පතක් ලබා ගත යුතුය. සමාගම ඒ අනුව කටයුතු කර | වැටුප් ලබාගැනීම සම්බන්ධයෙන් සේවක අත්සන් ලබා නොගැනීම අපි පිළිගනිමු. කනගාටුවට කරුණක් නම්, අපි වැටුප් ලබාගැනීම සඳහා සේවක තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමුඛත්වය නොදැක්වූ අතර, සේවකයින් | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | විසින් සපයනු ලබන බැංකු ගිණුම් වෙත වැටුප් සෘජුවම මාරු කිරීම කෙරෙහි අප විශ්වාසය තැබුවෙමු. එසේ වුවද, අපි නිවැරදි ක්‍රියාමාර්ග ගෙන 2023 මාර්තු මාසයේ සිට නිකුත් කරන ලද වැටුප් සඳහා සේවක තහවුරුවක් ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | |
| මුදල් රෙගුලාසි 756 | ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනකදී සමීක්ෂණ මණ්ඩල පත් කළ යුතු වුවද, සමාගම විසින් 2021 වර්ෂය සඳහා 2022 අප්‍රේල් මස සමීක්ෂණ මණ්ඩල පත් කර ඇති අතර සමීක්ෂණය 2022 ජුනි මස සිදු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | සමීක්ෂණ මණ්ඩල පත්කිරීමේ ප්‍රමාදය මෙන්ම සමීක්ෂණ මණ්ඩලය නියමිත කාල සීමාවෙන් ඔබ්බට පවත්වා තිබීම පිලිගන්නා බව කාරුණිකව දන්වා සිටිමු. මෙම ප්‍රමාදය ඇතිවූයේ මූලික වශයෙන් මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ වෙනස්වීම මෙන්ම ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති වූ සංකූලතා කිහිපයක් ද පෙර විගණන වාර්තාවල ඉස්මතු කර දැක්වීම හේතුවෙනි. සත්‍ය වශයෙන්ම, ප්‍රමාදය වූයේ ලිපි ලේඛන සහ පූර්ව සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයකින් පසු සියලුම මාරුවීම් සමඟ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට ගතවන කාලයයි. සමීක්ෂණ මණ්ඩලය පත් කර මූල්‍ය රෙගුලාසිවල දක්වා ඇති නිශ්චිත කාල රාමුව තුළ සමීක්ෂණ මණ්ඩලය විසින් සමීක්ෂණය සිදු කරන බවට සහතික වීමෙන් අපි 2022 දී මෙම ගැටළුව විසඳා ගත්තෙමු. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 835(2)(ඉ) | රෙගුලාසියට අනුව, ගොඩනැගිලි කුලී ගිවිසුමේ කාලසීමාව වසර තුනක් නොඉක්මවිය යුතුය, නමුත් සමාගම වසර හතරක් සඳහා කුලී ගිවිසුමකට එළඹ ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය , ICTA විසින් ජීවිත කාලය සඳහා හැකිතාක් සලකා බලා වසර 04ක කුලියට ගිය මුදල් සඳහා වටිනාකම සහතික කිරීමක් සිදු කරයි.<br>2.2.4 (අ.) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම ආරම්භ කරන අවස්ථාවේ එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සීමාව යටතේ වූ අතර අදාළ වන කොටස මාර්ගෝපදේශය 2.8.4 විය. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය |
| මුදල් රෙගුලාසි 1645 | මුදල් රෙගුලාසිවලට අනුව වාහන සඳහා දෛනික ධාවන සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අපි මුදල් රෙගුලාසි මඟින් නිශ්චිතව දක්වා ඇති ආකෘතිය පවත්වා ගෙන නොගියද; අවශ්‍ය විස්තර සහිත අපගේම ධාවන සටහන් අපි අනුගමනය කරමු. අනෙක් අතට, රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත මගින් අත්පොතෙහි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව තමන්ගේම පරිපාලන සහ මූල්‍ය අත්පොතක් සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බලය ලබා දේ. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමාගමේ සහ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,648,126 සහ රු.43,689,619 ලෙස ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,821,249,302 සහ රු. 1,819,768,568 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,862,897,428 ක් සහ රු.1,863,458,187 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ප්‍රදාන ආදායම අඩුවීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වියදම් ඉහළ යාමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2021 මාර්තු මාසයේදී ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණද, 2021 මාර්තු සිට ජූනි දක්වා කාලය සඳහා අලුතින් කුලියට ගත් ගොඩනැගිල්ලට සහ පැරණි ගොඩනැගිල්ලට පිළිවෙලින් රු. 20, 943,320 සහ රු. 6,048,000 කුලිය ගෙවා තිබුණි | ICTA නව ගොඩනැගිල්ල සමඟ 2021 මාර්තු මාසයේදී කොන්ත්‍රාත්තුව අත්සන් කර ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත.<br>අළුත්වැඩියා කිරීමේ කාර්යයට කොටස් කිරීම, සවිකිරීම්, ගෘහ භාණ්ඩ, ජාලකරණය යනාදිය ඇතුළත් වන අතර ඒවා පදිංචිය සඳහා අවම වශයෙන් මාස 3ක් අවශ්‍ය වේ. 2021 ජූලි මාසයේ සිට අපි කලින් කුලියට ගත් ගොඩනැගිල්ල භාර දී නව ගොඩනැගිල්ලට වෙත මාරු වුනෙමු. | අරමුදල් ආර්ථිකමය වශයෙන් ඵලදායී ආකාරයට භාවිතා කළ යුතුය. |

### 3.2 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් සමාගමේ වැටුප් සැකසීමේ කාර්යය සිදු කිරීම බාහිරින් ලබාගෙන තිබුණද, සමාගමේ වැටුප් සැකසීමේ කාර්යය බාහිරින් ලබා ගැනීම සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>තවද, සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාර අරමුදල් දල වශයෙන් රුපියල් මිලියන 6.5ක් පමණ එම සමාගම විසින් දෛනිකව රඳවාගෙන ඇති බවද නිරීක්ෂණය වී තිබුණි. | EPF/ETF සහ සේවකයන්ට ගෙවනු ලබන වැටුප් සඳහා වෙනම අරමුදල් ඉල්ලීමකින් තොරව EPF සහ ETF ඇතුළු මුළු වැටුප් ගෙවීම සඳහා එකවර තාක්ෂණ අමාත්‍යාංශයෙන් මුදල් ඉල්ලා සිටී.<br>මෙම අරමුදල් භාණ්ඩාගාරයෙන් ලැබුණු පසු, වැටුප් සැකසීම සඳහා, EPF, ETF, PAYE සහ අනෙකුත් අදාළ ගෙවීම් සඳහා ඒවා SSP (සේවා සපයන්නා) වෙත මාරු කරනු ලැබේ.<br><br>මෙම අරමුදල් සාමාන්‍යයෙන් සෑම මසකම 20 සහ 25 අතර කාලය තුළ SSP වෙත මාරු කරනු ලැබුවද, EPF සහ ETF සඳහා ගෙවීමට නියමිත දිනය ඊළඟ මාසයේ අවසානයේ තිබෙන බැවින්, ඊළඟ මාසයේ EPF සහ ETF ගෙවීම් සඳහා SSP විසින් කටයුතු කරන බව සැලකිල්ලට ගත යුතුය.<br><br>එහි ප්‍රතිඵලයක් වශයෙන්, SSP ඊළඟ මාසය අවසන් වන තෙක්, විශේෂයෙන් පසුකාලීන වැටුප් ගැලපීම් සඳහා අරමුදල් රඳවා තබා ගනු ලබයි.<br><br>එසේම දෙසැම්බර් මාසය සඳහා වන EPF සහ ETF ගෙවීම් සම්බන්ධයෙන්, අරමුදල් දැනටමත් SSP වෙත මාරු කර ඇති බැවින්, ඒවා ගෙවිය යුතු ලෙස අප ගණන් නොගත් බව පැහැදිලි දැක්විය යුතුය.<br><br>නිවැරදිවම ප්‍රකාශ කිරීමේදී නම්, දෙසැම්බර් මාසය සඳහා EPF සහ ETF තාක්ෂණික | අරමුදල් බාහිර පාර්ශ්ව වෙත මාරු නොකළ යුතුය. |

වශයෙන් ගෙවිය යුතුව ඇති බව කෙනෙකුට තර්ක කළ හැකි අතර, SSP වෙත මාරු කරන ලද මුදල දෙසැම්බර් අවසානයේ ලැබිය යුතු යැයි සැලකිය හැක. කෙසේ වෙතත්, අනාගතයේදී එවැනි සංකූලතා වැලැක්වීම සඳහා, අරමුදල් මාරු කළ මාසය තුළම EPF සහ ETF ගෙවීම් ක්‍රියාවට නංවන ලෙස අපි දැනටමත් SSP ආයතනය වෙත දැනුම් දී ඇත.

## 3.3 ප්‍රසම්පාදන කලමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම සඳහා කුලී ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමේදී 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ චක්‍රලේඛයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.3 මාර්ගෝපදේශයේ විධිවිධානවලට සමාගම අනුකූලවී නොතිබුණි.<br><br>තවද, සමාගමේ සභාපතිවරයා 2020 දී මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට අනුමත කරන ලද අතර ගොඩනැගිල්ලේ භෞතික පරීක්ෂණයට සහභාගී වී තිබූ අතර සාකච්ඡා කමිටුවේ සභාපති ලෙස ද කටයුතු කර තිබුණි.<br><br>එමෙන්ම 2021 වර්ෂයේදී අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමත කර අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කිරීම විගණනයේදී නිරීක්ෂණය විය. | 2.8.4 වගන්තිය යටතේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව සභාපතිවරයා විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කර ඇත.<br><br>සභාපතිවරයා භෞතික පරීක්ෂණ කණ්ඩායම සමඟ සහභාගි වී සාකච්ඡා කමිටුවේ ප්‍රධානියා වූයේ ගත යුතු ප්‍රසම්පාදන තීරණයේ වැදගත්කම නිසා බව.<br><br>2021 වර්ෂයේදී එම සභාපතිවරයා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස පත් කරන ලදී.<br><br>ඉදිරිපත් වී ඇති සියලුම මිල ගණන් DPC සීමාවට වඩා ඉහළින් පැවතීම හේතුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක (MPC) පෙර දැක්වීමක් යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දිගටම කරගෙන යාමට ICTA විසින් තීරණයක් ගන්නා ලදී.<br><br>2021 ජනවාරි 1 දිනැති අංක ICTA/PRO/GEN/05/21 ලිපියේ (ගොනුවේ ෆෝලියෝ අංක 282) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට ලේකම්වරයාම හැර වෙනත් සුදුසු කාර්ය මණ්ඩලයක් නොසිටි බව පැහැදිලි කළ යුතු වේ. (MPC) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන NPA චක්‍රලේඛයට අනුව , සියලුම ප්‍රසම්පාදන භාණ්ඩ, වැඩ සහ සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | **ආරක්ෂක**<br><br>ICTA නව පරිශ්‍රය වෙත 2021 ජුනි මාසයේදී නැවත ස්ථානගත කරන ලද අතර අනෙකුත් මහල්වල ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පවතී.<br>ICTA විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා සුදුසු සේවා සපයන්නෙකු තෝරා ගන්නා තෙක්, එම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර ගිවිසුම්වලට එළඹීමකින් තොරව සමාගම විසින් ආරක්ෂක, පිරිසිදු කිරීම සහ තේ සේවාවන් ලබාගෙන තිබුණි.<br>තවද, වර්ෂය සඳහා පිළිවෙළින් රුපියල් 1,049,069, රු. 2,025,325 සහ රු.1,042,907 ගෙවා තිබුණි. | ආයතනය නැවත ස්ථානගත කරන අවස්ථාවේ දී ලබා ගත හැකි ආරක්ෂක සමාගමේ සේවාවන් දිගටම කරගෙන ගියේය.<br>කෙසේ වෙතත්, 2022 දී ICTA විසින් තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා සුදුසු සේවා සපයන්නෙකු ලබා ගන්නා ලදී.<br><br>**පිරිසිදු කිරීම**<br><br>ICTA විසින් සැපයුම්කරු තෝරා ගන්නා අතර විශේෂිත සැපයුම්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය වුවද සේවා දිගු අත්සන් කිරීමෙන් පමණක් ගිවිසුම දිගටම දීර්ඝ කරයි.<br>ගැටලුව දැන ගැනීමෙන් අපි තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් අනුගමනය කර 2022 මැයි සිට බලපැවැත්වෙන පරිදි සැපයුම්කරු තෝරා ගනිමු.<br><br>**තේ සැපයීමේ සේවය**<br><br>ICTA විසින් සැපයුම්කරු තෝරා ගන්නා අතර විශේෂිත සැපයුම්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය වුවද සේවා දිගු අත්සන් කිරීමෙන් පමණක් ගිවිසුම දිගටම දීර්ඝ කරයි.<br>ගැටලුව දැනගත් අපි සැපයුම්කරු තෝරා ගැනීම සඳහා තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කරන්නෙමු | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 නොවැම්බර් 16 දිනැති අංක: 20/1784/301/012 දරණ කැබිනට් තීරණය ප්‍රකාරව 2021 වසරේ සිට සමාගමේ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය නව වැටුප් ව්‍යුහයක් මත ස්ථිර ලෙස අන්තර්ග්‍රහණය කර තිබුණේ එකී කැබිනට් තීරණයේ දක්වා ඇති පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව නොවුණි.<br>• "ජාතික ඩිජිටල් ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය" ක්‍රියාවට නැංවීම සඳහා 2021 සිට 2025 දක්වා වසර 05 ක කාලය ආවරණය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | ජාතික ඩිජිටල් ප්‍රතිපත්ති සහ උපායමාර්ග සමඟ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව, ICTA විසින් ඩිජිටල් රජය, ඩිජිටල් ආර්ථිකය සහ ඩිජිටල් සේවා සඳහා විස්තර උපාය මාර්ග සකස් කර ඇත.<br>පවතින කාර්ය මණ්ඩලය මෙම එක් එක් සිරස් ආකාරයට වෙන් කර ඇත්තේ උපාය මාර්ග සහ සැලසුම් සහගත වැඩ බැලීම සඳහා යෙදවා ඇත.ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව, ICTA හි කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ද සිටියහ. මෙම කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් සමහරක් ඔවුන් සම්බන්ධ වූ ව්‍යාපෘතිවලටම අනුයුක්ත කර ඇත.<br><br>ව්‍යාපෘතියේ මෙහෙයුම් පුනරාවර්තන වියදම් සහ එකී ව්‍යාපෘතිවල නියැලී සිටින උපදේශකයින්ට ගෙවිය යුතු ගාස්තු යන | කැබිනට් තීරණයේ උපදෙස් පිළිපැදිය යුතුයි. |

- ව්‍යාපෘතියට අදාළ උපදේශන ගාස්තුවලින් ව්‍යාපෘති වියදම් අයකර ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම සහ ඒ සඳහා අය වැය ප්‍රතිපාදනවලින් අනෙකුත් වියදම් වෙන්කර ගැනීම.

දෙකම ඇතුළත් එකහ වූ මිලක් සමඟින් ICTA බාහිර පාර්ශ්ව සමඟ ගිවිසුම්වලට එළඹී ඇත.

අමතර තොරතුරු සඳහා, ආදායම් බලපත්‍රයට අදාළ සංවෘත ගිවිසුම මෙන්ම විද්‍යුත් ඉඩම් සහ උසාවි ස්වයංක්‍රීයකරණය පිළිබඳ ගිවිසුම වෙත කාරුණිකව භාවිතා කරන ලෙස දන්වමි. තව ද වීඩියෝ සම්මන්ත්‍රණ හැකියාවන් ඇතුළුව, අදාළ පාර්ශ්ව මත අයකරනු ලබන මෙහෙයුම් පුනරාවර්තන වියදම් එමඟින් ගෙනහැර දක්වයි.
2022 දී ඩිජිටල් සෞඛ්‍යය සඳහා බඳවා ගත් සියලුම කාර්ය මණ්ඩලය පාහේ අදාළ ව්‍යාපෘතිය සඳහා බඳවා ගන්නා ලද ආකෘතිය පුළුල් කරන ලදී. එහිදී ඔවුන්ගේ වේතනය අදාල ව්‍යාපෘතියට අය කර ඇත.
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට (ICTA) තෙවන පාර්ශවයන්ට ගෙවන උපදේශන ගාස්තු සහ බාහිර ව්‍යාපෘති සඳහා ඔවුන්ගේ මිල ගණන් යටතේ සෘජුවම දරන ලද මෙහෙයුම් පුනරාවර්තන වියදම් ඇතුළත් වේ. සාරාංශයක් ලෙස, ව්‍යාපෘතියේ මෙහෙයුම් පුනරාවර්තන වියදම් සහ එම ව්‍යාපෘතිවල නියැලී සිටින උපදේශකයින්ට ගෙවිය යුතු ගාස්තු යන දෙකම ඇතුළත් එකහ වූ මිලක් සමඟ ICTA බාහිර පාර්ශ්ව සමඟ ගිවිසුම්වලට එළඹ ඇත.

අමතර තොරතුරු සඳහා, ආදායම් බලපත්‍රයට අදාළ සංවෘත ගිවිසුම මෙන්ම වීඩියෝ සම්මන්ත්‍රණ හැකියාවන් ඇතුළුව ඊ-ඉඩම් සහ උසාවි ස්වයංක්‍රීයකරණය පිළිබඳ ගිවිසුම, අදාළ පාර්ශවවලින් අයකරනු ලබන මෙහෙයුම් පුනරාවර්තන වියදම් යොදා ගත හැකිය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 පරිච්ඡේදය.<br>මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත වාර්ෂික වාර්තාව සහ ගිණුම් කෙටුම්පත් විගණකාධිපති වෙත භාර දිය යුතු වුවද, සමාගම දින 425 කට පසු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | වාර්ෂික වාර්තාව සැකසීමේ ප්‍රමාදයට හේතුව විගණනය සඳහා ගිණුම් සැකසීමට ප්‍රමාද වීමයි. මේ වන විට, 2019 සහ 2020 වසර සඳහා ගිණුම් අවසන් කර ඇති අතර, 2021 වසර සඳහා විගණනය තවමත් සිදු වෙමින් පවතී. 2023 නොවැම්බර් මාසය අවසන් වීමට පෙර 2022 වර්ෂය සඳහා විගණන කටයුතු අවසන් කර ඊට අනුරූප වාර්ෂික වාර්තා 2024 ජනවාරි අවසානයට පෙර ඉදිරිපත් කිරීම අපගේ සැලසුමයි.<br><br>මෙම පසුබෑම ඉවත් වූ පසු, අපි ගිණුම් සහ වාර්ෂික වාර්තා යන දෙකම අවසන් කිරීම සඳහා නියමිත කාලසීමාවන්ට අනුකූල වන බවට ඔබට සහතික වෙමු. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |